**බදුල්ල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 27 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ජුනි 27 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, බදුල්ල ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට බදුල්ල ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.678,400 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 561,289 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇසතමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 3,442 | 2,840 | 1,372 |
| (ii) | බදු කුලී | 2,312 | 2,016 | 180 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 710 | 252 | - |
| (iv) | වෙනත් ආදායම් | 31,406 | 14,556 | 172 |

### 2.2.2 උසාවි දඩ

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට රු. 2,500,000 ක උසාවි දඩ මුදලක් ලැබිය යුතුව තිබුණි.

### 2.3 අවිධිමත් ගනුදෙනු

(අ) සභාව විසින් ගේජ් 28 ප්‍රමාණයේ දිග අඩි 10 සෙවිලි තහඩු 134 ක් මිලදී ගැනීම සඳහා අවස්ථා 08 කදී රු.190,950 ක් වැයකර තිබුණ අතර, ඒ සම්බන්ධයෙන් සැපයුම්කරුවන් වෙත මිල කැඳවීම් ලිපි යොමු නොකිරීම, මිල කියුම් ලියාපදිංචි තැපෑලෙන් ලද බවට හෝ ටෙන්ඩර් පෙට්ටියකට බහාලන ලද බවට සාක්ෂි අනාවරණය නොවීම හා මිල කියුම්වල කාර්යාලයීය දින මුද්‍රාව යොදා නොතිබීම වැනි කරුණු නිරීක්ෂණය විය.

(ආ) පළාත් පාලන කොමසාරිස්ගේ 2009 නොවැම්බර් 11 දිනැති අංක 12/අ/15/1 දරන ලිපිය අනුව සභාපතිවරයකු සඳහා අනුමත මාසික ඉන්ධන ප්‍රමාණය ඩීසල් ලීටර් 222 සීමාව ඉක්මවා 2012 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුල ඩීසල් ලීටර් 2111 ක් සඳහා රු. 242,334 ක මුදලක් සභා අරමුදලින් වැයකර තිබුණි.

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(1) (i) වගන්තිය ප්‍රකාරව සේවකයින් බඳවාගැනීමේ දී පළාත් පාලන කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතිය ලබා නොගෙන ආදේශක පදනම මත

බඳවාගත් සේවකයින් 25 දෙනෙකු වෙනුවෙන් පත්වීම් ලබාදී 2012 වර්ෂය තුළදී එම සේවකයන් වෙනුවෙන් රු.3,065,357 ක වැටුප් හා දීමනා සභා අරමුදලින් ගෙවා තිබුණි.

## 2.4 **මෙහෙයුම් / කළමනාකරණ අකාර්යක්ෂමතා**

(අ) 2012 වර්ෂයේ උපමානපාදක වැඩසටහන යටතේ ඌව පළාත් සභාවේ ප්‍රතිපත්ති සැලසුම් සම්පාදන දෙපාර්තමේන්තුව විසින් නෙළුම්ගම සිට ගොවිපල දක්වා පිවිසෙන අධි පාරේ පඩිපෙළ සකස් කිරීම සඳහා 2012 ජූලි 20 දින ලබා දුන් රු.50,000 ක මුදල එම කර්මාන්තය ඉටු නොකිරීම හේතුවෙන් 2012 දෙසැම්බර් 12 දින ප්‍රතිපත්ති සැලසුම් සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ආපසු ගෙවා තිබුණි.

(ආ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 153 වන වගන්තිය අනුව රඳවාගැනීමේ බදු අඩු කළ මාසයට පසු මාසයේ 15 වන දිනට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු රු.70,145 ක රඳවා ගැනීමේ බදු ප්‍රේෂණය කර නොතිබුණි.

(ඇ) 2011 ජූලි 25 දින අනතුරකට භාජනය වී තිබූ ට්‍රැක්ටරය කිසිදු අලුත්වැඩියාවක් නොකර සභා අංගනයේ ගාල්කර තිබුණි.

## 3. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ආදායම් පරිපාලනය
(ආ) අයවැය පාලනය
(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය